2026 ක් වූ මාර්තු මස 11 වන දින දිය

පවුල් පිලිබඳ නීති

දික්කසාදය - Divorce

දික්කසාද ඉල්ලුම් පත්‍ර Federal Circuit and Family Court (Division 2) වෙත ඉදිරිපත් කළ යුතුවේ.

දික්කසාද ඉල්ලුම් පත්‍රයක් සැමියා හා/හෝ බිරිඳ යන දෙදෙනාට තම කැමැත්ත පරිදි එකට හෝ වෙන වෙනම අධිකරනයට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා Family Law Act 1975 (Cth) යටතේ ඔබ ඔස්ට්‍රේලියාවේ පුරවැසියෙකු බව හෝ ස්තිර පදිංචිය ඇති බව හා ඉල්ලුම් කිරීමට පෙර මාස 12 ක් ඔස්ට්‍රේලියාවේ පදිංචි වී සිටි බවත් තහවුරු කළ යුතුයි. ඒ සඳහා ඔබ විවාහයෙන් මාස 12 ක කාලයක් වෙන් වී සිටි බවට තහවුරු කල යුතුය. මේ පිලිබදව වැඩි විස්තර අපගේ පළපුරුදු සොලිසිටර්වරුන් ගෙන් විමසන්න.

තවද ඔබගේ විවාහ සහතිකයේ පිටපතක් අධිකරනයට ඉදිරිපත් කළයුතු අතර එය සිංහළ භාෂාවෙන් ඇත්නම් National Accreditation Authority for Translators and Interpreters (NAATI) සුදුසුකම් ඇති අයෙකු ලවා එහි සහතික කරන ලද ඉංග්‍රීසි පරිවර්තනයක් සමග ඉදිරිපත් කළ යුතුවේ.

දික්කසාද ඉල්ලුම් පත්‍ර පිලියෙල කිරීම හා ඔබ වෙනුවෙන් පෙනී සිටීමට අපට හැකියි.

විවාහක දේපල බෙදා ගැනීම - Financial Settlement

විවාහක දේපල බෙදා ගැනීමේ ක්‍රියා පටිපාටිය දික්කසාදයට අමතරව වෙනමම ඉල්ලුම් කළයුතුවේ. ඔබ දෙපලට දේපළ තිබුනත් හෝ නැතත් දෙපාර්ෂවයේ මුදල් ගනුදෙනු නිම කිරීම සඳහා වූ ක්‍රියාපටිපාටියක් ලෙස ඉල්ලුම් කළ යුතු බව නීතියේ (S.81 of Family Law Act 1975 (Cth) සඳහන්වේ. මෙම ඉල්ලුම් කිරීමේදී දෙපාර්ෂවයේ වත්කම් හා බැරකම්, විවාහයට දෙදෙනා ගේ දායකත්වය කොපමනද වූවාද යන්න, වර්තමාන හා අනාගත ආර්ථික තත්වය ඇතුළුව මෙම බෙදීම සාධාරන හා යුක්තිසහගතද යන බව අධිකරනය විසින් සලකා බලනු ඇත.

එසේ හෙයින් විවාහක දේපල බෙදීමේ ගිවිසුම්, වත්කම් පැවරීම් සහ දරුවන්ගේ නඩත්තු වියදම් ඇතුලු දරුවන්ගේ රැකවරන ගිවිසුම් සම්බන්දයෙන් අපට උපදෙස් දීම හා පෙනී සිටිය හැක.

විශේෂයෙන් දරුවන් සිටින අයගේ විවාහයන් නොයෙකුත් හේතුන් මත දෙදරා යාම් වලට ලක්වන අවස්ථාවල දී එකී පුද්ගලයන් ඉතා අසහනකාරී මානසික පීඩාවන් වලට ලක්වේ. මේ පිලිබදව එම අවස්ථාවන් හී දී ඔබ නිසි උපදෙස් ලබා ගත්තාද?

අපගේ පළපුරුදු හා කාරුනික නීතීඥවරුන් විසින් මේ කාලය තුලදී ඔබට නිසි මාර්ගයන් හා උපදෙස් ලබා දෙනු ඇත.

වැඩි දුර විස්තර සඳහා අපව අමතන්න.